# අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා සහ ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා අතර පැවති දුරකථන සාකච්ඡාව

*ඉන්දීය පුවත්පත් තොරතුරු කාර්යාංශය විසින් 2020 මැයි 27 වන දින නිකුත් කරන ලදී*

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස වසර 50ක් සම්පූර්ණ කිරීම නිමිත්තෙන් සුබ පැතීම සඳහා අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා අද දින ශ්‍රී ලංකා අග් රාමාත්‍ය අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා වෙත දුරකථන ඇමතුමක් ලබා දුන්නේය.

මෝදි මැතිතුමා අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ දීර්ඝ කාලීන දේශපාලන දිවිය තුළ ශ්‍රී ලංකාවේ සංවර්ධනයට ලබා දුන් දායකත්වයන් සිහිපත් කළ අතර එතුමාගේ ඉදිරි අනාගතය සඳහා සිය සුභාසිංශන එක් ක ළේය.

එසේම, අග්‍රාමාත්‍යතුමා ශ්‍රී ලංකාවේ වෙසෙන ඉන්දීය සම්භවයක් ඇති දමිළ ජනතාවගේ ප්‍රමුඛ පෙළේ නායකයකු වූ ආරුමුගම් තොණ්ඩමන් මැතිතුමාගේ හදිසි අභාවය සම්බන්ධයෙන් සිය ශෝකය පළ කළේය . තොණ්ඩමන් මැතිතුමා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සංවර්ධන සහයෝගීතාවය ඉදිරියට ගෙන යාමේදී ඉටු කළ භූමිකාව එතුමා මෙහිදී සිහිපත් කළේය.

නායකයන් දෙපළ කොවිඩ්-19 වසංගත තත්වයෙන් ඇති වන සෞඛ්‍යමය සහ ආර්ථික බලපෑම් පිළිබඳව ද එම අභියෝග ජය ගැනීම සඳහා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව ද සාකච්ඡා කළෝය. මෙම අභියෝගාත්මක කාලය තුළ ශ්‍රී ලංකාවට හැකි සෑම සහයෝගයක්ම ලබා දීමට ඉන්දියාව සූදානම් බවට මෝදි මැතිතුමා අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාට සහතික විය.

****

VRRK/KP